# ඓතිහාසික අම්බුලුගල ශ්‍රී දන්තපාය රාජමහ විහාරයේ මහනුවර යුගයේ සිතුවම් හා කෝට්ටේ යුගයට අයත් කැටයම් විමර්ශනය

ඊ- ඩී- අනුරාධා අබේසේකර

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
70chanaka@gmail.com

---

මහනුවර සහ කෝට්ටේ යුගයන් ද්විත්වය තුළ සිතුවම් හා කැටයම් කලාව පෝෂණය වූ දුර්ලභ අවස්ථාවක් සොයා යාම අරමුණු කොට ගෙන මෙම පර්යේෂණය සිදු කරනු ලැබිණි. පර්යේෂණ ප්‍රදේශය වූයේ කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අම්බුලුගල ග්‍රාමයයි. දෙමහල් ටැම්පිට විහාර ගෘහයක් සහිත අම්බුලුගල ශ්‍රී දන්තපාය විහාරස්ථානය පර්යේෂණයේ තේමා විහාරස්ථානය ය. පැරණි යුග බෙදීම් අනුව මෙම විහාරය කෝට්ටේ යුගයට සමකාලීන ව බිහි වූ උපරාජධානියක් වූ මායා රාජ්‍යයට අයත් වන අතර සතර කෝරළේ ගලබඩ කෝරළේ එගොඩපොත පත්තුවෙහි පිහිටා ඇත.

අලංකාර කැටයම් සහිත ගල් කුළුණු 28 ක් මත මෙම දෙමහල් ටැම්පිට විහාරය සමබර ව නිමවා ඇත. විහාරයට පිවිසීම සඳහා ද කලාත්මක දූව පඩිපෙළක් නිර්මාණය කර ඇති අතර නැගෙනහිර දොරටුවේ ඇති කැටයම් සහිත ඉතා අලංකාර ගල් උළුවස්ස විහාරයේ ඇති සුවිශේෂී ම අංගයකි. මෙහි කෝට්ටේ යුගයේ කැටයම් ශිල්පය මැනවින් තහවුරු කෙරෙන අතර දෙපස කණු දෙකෙහි ඉතා විසිතුරු මල් ලියකම් සහිත නළඟන රූ කැටයම් කර ඇත. මෙම ටැම්පිට විහාරගෙයි ඇතුළත බිත්ති සතරෙහි හා සිවිලිමෙහි හිස් අවකාශයෙහි සිතුවම්වල මහනුවර යුගයට අයත් ඉතා දුර්ලභ අලංකරණ දැකිය හැකිය.

එසේ ම සාම්ප්‍රදායික මහනුවර සිතුවම් අතර වියන්තල නෙළුම්මල් මෝස්තර රතු පැහැති පසුබිමක දැකගත හැකි වුවත් මෙහි වියන්තල නෙළුම්මල් නිල් පසුබිමක් මත නිරූපිත ය. ප්‍රදේශයට හා අම්බුලුගල විහාරස්ථානයට සුවිශේෂ වූ පුද්ගල චරිත ද්විත්වයක් ද සිතුවම් අතර දැකිය හැකි වීම විශේෂත්වයකි. ඒ අම්බුලුගල ගංආරච්චි මහතා හා අස්ගිරි පාර්ශවයේ මහානායක ධූරය දැරූ වත්තේගම ධම්මකිත්ති ශ්‍රී සුමංගල මහතෙරණුවන් වේ. එම හිමියන් විසින් මෙම විහාර කර්මාන්තයේ කටයුතු නිම කිරීම සඳහා උපදෙස් ලබා දුන් බව සිතුවම් අතරම දක්වා ඇති හෙයින් උන්වහන්සේ ජීවත් ව සිටි 1869-1885 කාලයට මෙම සිතුවම් සමකාලීන විය යුතු ය. එහෙත් විහාරයේ සෙසු සිතුවම් ඊට වසර කිහිපයකට ඉහත දී හෝ වෙනත් පුද්ගලයෙකු විසින් හෝ අඳින ලද සිතුවම් බව අධ්‍යයනයෙන් අනාවරණය කර ගත හැකි විය.

ප්‍රමුඛ පද : මහනුවර යුගය, කෝට්ටේ යුගය, ශ්‍රී දන්තපාය විහාරස්ථානය